## රත්න ශ්‍රී විජේසිංහ

- ශාස්ත්‍රපති උපාධිධරයෙකි.
- අධ්‍යාපන නිලධාරියෙකි.
- ගුරු විද්‍යාල කථිකාචාර්යවරයෙකි.
- සහකාර ලේකම්වරයෙකි.
- පුවත්පත් කලාවේදියෙකි.
- ගුවන් විදුලි වැඩසටහන් සම්පාදකවරයෙකි.
- ලේඛකයෙකි.
- කවියෙකි
- ගේය පද නිබන්ධකයෙකි.

### • කවියාගේ අනුභූතිය.

කවියා ගුරුවරයෙකු ලෙස පුහුණුව ලබා ඉන් පසුව පත්වීම ලැබුණේ මොනරාගල දිස්ත්‍රික්කයේ හුලංදා ඔය ප්‍රදේශයේ පිහිටි හුලංදාව පාසලටය. දිනපතා ඔහුගේ නෙත ගැටුණු හුලංදා ඔයත්, ඒ දුෂ්කර ගම්මානයත්, එහි වාසය කළ අහිංසක ගැමියන්ගේ දුෂ්කර ජීවිතයත් ඔහුගේ පන්හිඳ තව තවත් මුවහත් කළේය. තම කුටුම්භයෙන් වෙන් වී සිටින රත්න ශ්‍රී විජේසිංහයන්ට මෙම දුෂ්කර ජීවිතය අමිහිරි නොකළේ ඔහු කවියෙකු වූ බැවිනි. එම කටුක අත්දැකීම් ගීතයට කවියට නගා ලාංකේය ජන හදවතට ආමන්ත්‍රණය කිරීමට ඔහුට හැකි විය. එහි ඵලය අපිද බුක්ති විඳිමු. එම නිර්මාණ ඔහු සම්මානනීය ලේඛකයකු, කවියකු, ගීත නිබන්ධකයකු බව පත් කළේය. තම ආදරණීය බිරිඳ හා දරුවන්ගෙන් වෙන් ව ගෙවූ දිවිය දුෂ්කර වුව ද එම අත්දැකීම් ද මුසු කරමින් පැන් තුඩ මෙහෙයවීය. ඉන් ජනිත වූ "මගෙ බිසවුණේ අසාපත්" යන පද වැල ගුණදාස කපුගේ සූරින්ගේ මුවින් ගැයෙන්නේ සොඳුරු ගීතයක් ලෙසිනි

සුදු නෙළුම කෝ සොර බොර වැවේ
මල් සුවඳ දුන් මහියංගනේ
පුන් පෝය දා පසලොස්වකේ
මල් නෙළා විකුණූ පන්සලේ

වැවට කළුවර යා වුණා
සංසාර දුක බෝ වුණා
නෙළූ මල් ටික ඉහිරුණා
එහා ඉවුරට පා වුණා

සිහින් සිරිපොද වැහුණා
ඉවුරු දෙකොපුල සේදුණා
සුදු නෙළුම් මල දැස පිය වී
මෙහා ඉවුරට පා වුණා

පණ්ඩිත් අමරදේවයන් විසින් ගැයෙන "සුදු නෙළුම කෝ සොරබොර වැවේ" ගීතයට පසුබිම් වූයේ ද හුලංදාව පාසලෙහි ඉගෙනුම ලැබූ දුප්පත් දැරියක් මුහුණ දුන් ඛේදනීය අත්දැකීමයි. හුලංදාව ඔයේම පාවී ගිය ඇගේ ප්‍රාණය නිරුද්ධ සිරුර කරුණා රසය වැහෙන රසවත් නිර්මාණයක් වූයේ ශ්‍රී ලාංකේය ජන හදවත් කම්පනය කරවමිනි

"වස්සානය"ට බලපෑවේද යථෝක්ත අනුභූතීන් මය. හුලංදා ඔය ඉඩෝරයට සිඳී යාමත් වැසි සමයේ දී ජලයෙන් පිරී යාමත් කවි ඇසින් දකිමින් එහි සුන්දරත්වය ද ඉන් එහා ගිය මිනිස් ජීවන දහම ද ඔය හා මනාව සංකලනය කරමින් දාර්ශනික ප්‍රවේශයක් ද පැදි පෙළ හා බද්ධ කරයි. කාව්‍යමය අනුභූතියට නවමු හැඩයක් හා වටිනාකමක් එක් කිරීමට ඔහුගේ දැක්ම හා චින්තනය උදක්ම බලපෑවේය.

- **ප්‍රස්තුතයට අදාළ වූ ගැමි බස යොදා ගැනීමෙන් අර්ථ රසය තීව්‍ර කිරීම.**

උදා:-

" ඔය දැල දොඩමළුය සුවඳ බැරුවා ඉන්ට"

"පුර පසේ සඳ එක්ක මෝරන්ට"

"දිය නිලන වැසි සමේ"

" දෙවැට දිග කරඳ වැල්"

" හිනැහේය මා එක්ක"

"රැගෙන දෝතට පුරා"

- **උපමා රූපක යොදා ගැනීම.**

උදා:-

"ඔබෙ නයන නිල් පොකුණ"

"හිරු එළිය මිහිරි මවු කිරි වගේ"

- **කාව්‍යෝක්ති බහුලව භාවිත කරමින් පැදි පෙළට නැවුම් බවක් ලබා දීම.**

උදා:-

"ඔය දැල දොඩමළුය සුවඳ බැරුවා ඉන්ට

"පුර පසේ සඳ එක්ක තරඟයට මෝරන්ට"

"කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩා ගෙන"

"දිය නිලන වැසි සමේ රැලි නගා උතුරාය"

"සන්නාලියන් කොහොම ඇන්දාද දේදුන්න"

"වැසි සමේ රෑ ඇඳේ සිහිනයක් වී ඉන්න"

"ගඟ නැවත පිරිපුන් ය "

"කටු පොකුර සිප ගතිමි හෙට මලක් වනු පිණිස"

- **උත්ප්‍රේක්ෂාලංකාර**

උදා:-

"ඔය දැල දොඩමළුය - ඔය සජීවී වස්තුවක් ලෙස පෙනී සිටියි."

"කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩා ගෙන"

"හුලංදා ඔය කිමද මල්වරව ඉල්මහට"

"ඔබෙ නයන නිල් පොකුණ"

"රමණීය වන ගැබෙහි මොනරුණට පිල් වියන"

"ඇදි ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන් ය"

"වැහි වළාකුළු රංචු කඳු මුදුන්වල ලගින"

- **ධ්වනිතාර්ථවත් යෙදුම්**

  උදා:-

  "පුරපසේ සඳ එක්ක තරඟයට මෝරන්ට

  "හුලන්දා ඔය කිමිද මල්වරව ඉල්මහට"(ඔය යෞවනියක්ව ඇත.)

  " කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන-(සුදු මල් පොකුරක් පිපී ඇත.)

- **නව්‍යතම කාව්‍ය සංකල්ප මතින් පරිසරය ජීවය ලැබූ අයුරු පෙන්වීම.**

  උදා:-

  "සෙනේහය පිරී ගිය ඔය නයන නිල් පොකුණ"

  "සන්නාලියන් කොහොම ඇන්දාද දේදුන්න"

  "වැහි වතුර ඉහිනවා නම් ඔවුන් විහිළුවට"

- කවියා ජීවිතය ගංගාවක් ලෙස දකියි.

  තම බිරිඳ සිනාසෙනු සේ ම ගඟ ද සිනාසෙයි.

  "සොඳුර නුඹ වාගේම හිනැහේය මා එක්ක"

  මෙහිදී බිරිඳ ද ගඟ ද තරුණ බැවින් වැස්සෙන් සතුටට පත්වෙයි.

- අටලෝ දහම" යන දාර්ශනික අදහස් මතු කිරීම.

  "ඔබෙ සිනාවෙන් නිවේ හුණුව ගිය ලේ නහර"

- ජීවිතය දුක් දොම්නස් පිරුණ ද ඉන් පලා යා නොයුතු බව ද කරදර බාධක කෙළවර ජයග්‍රහණය උදා කර ගත හැකි බව ද පසක් කරයි.

  "දුෂ්කරය කියා හැක යා යුතු ද ජීවිතය"

  "කටු පොකුරු සිප ගනිමි හෙට මලක් වනු පිණිස"

ගඟ ද දුෂ්කර කාලය නිමා කර දැන් සතුටට පත් ව ඇත. ජීවිතය ද එබඳු ය.

A කොටසෙන් දැක්වෙන ප්‍රකාශ සඳහා ගැළපෙන පිළිතුර B තීරුවෙන් සොයා ඉදිරියෙහි ඇති කොටුවෙහි පිළිතුරට හිමි අංකය යොදන්න.

| A | | B |
|---|---|---|
| 1.රසය ආත්ම කොට ගත් වාක්‍ය කවියකි. | | 1. හිරු එළිය මිහිරි මවු කිරි වගේ. |
| 2.ගැමි වහර යොදා ගැනීමට උදාහරණයකි. | | 2. පුර පසේ සඳ එක්ක තරඟයට මෝරන්ට |
| 3.උපමාලංකාරයට නිදසුනකි. | | 3.එස්. ටී. කොල්රිජ්. |
| 4.උත්ප්‍රේක්ෂාලංකාර යෙදුමකි. | | 4. දුෂ්කරය කියා හැර යා යුතුද ජීවිතය. |
| 5. නව්‍යතම කාව්‍ය සංකල්පයකි. | | 5. කටු පොකුරු සිප ගතිමි හෙට මලක් වනු පිණිස. |
| 6.කවියාගේ ජීවන දෘෂ්ටිය මතු කරයි. | | 6. හුලංදා ඔය කිමිද මල්වරව ඉල්මහට |
| 7. කවිය වනාහි හොඳම වචන පිළිවෙලට යෙදීමයි. | | 7.රැගෙන දෝතට පුරා |
| 8. ධ්වනිතාර්ථවත් යෙදුමකි. | | 8. විශ්වනාථ |
| 9. හෙට දිනයේ සතුට උදා වනු ඇත. | | 9. ඇදි ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන් ය. |
| 10. ගඟ යෞවනියක් ව ඇත. | | 10.සන්නාලියන් කොහොම ඇන්දාද දේදුන්න. |